Sandamal Rajapakshe LLM (Col),
Attorney-at-Law,
MBCS, ACS, Dip.in Intellectual Property (UK)
Dip.in Int.Com. Arbitration (UK)
Dip. in Forensic Medicine

Office: 418/15, Weli Para
Thalawathugoda
Tel: +94 71 41 97 650
E-mail: sandamal2000@yahoo.com

04/07/2025

SC contempt of Court No 10/2024

මෙම නඩුව විජයදාස රාජපක්ෂ මහතා විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කරනු ලැබුවේ 1 හා 2 වගඋත්තරකරුවන් විසින් " Truth With Chamuditha" You Tube නාලිකාවේ පල කල වැඩ සටහනක් මාර්ගයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය අපහාසයට ලක්වන ආකරයට අදහස් දක්වා ඇති බවයි ඇතැම් මාධ්‍ය මෙම නඩුව විජයදාස රාජපක්ෂ මහතාට අපහාස කිරීම හේතුකොට ගෙන ගොනු කරන ලද නඩුවක් ලෙස වැරදි යට අර්ථ දක්වා ඇත.

අද දින මෙම නඩුවේ කරුණු තහවුරු කිරීම සඳහා කැඳවූ අවස්ථාවේ දී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන් ලා දන්වා සිටියේ මෙම නඩුවේ දී පාර්ශවයන් අතර සමතයක් ඇති කර ගත හැකි නම් අධිකරණයට එය සලකා බැලිය හැකි බවත්ය . ඉන් අනතුරුව එකී කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව 1 හා 2 වගඋත්තරකරුවන් විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේ එකී වැඩසටහන නිසා අධිකරණයට අපහාසය ක් සිදුවී ඇත්නම් ගරු අධිකරණයෙන් ඒ පිලිබඳව සමාව ඉල්ලා සිටින බවයි .එකී කරුණු මත විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගාස්තු රහිතව නිශ්ප්‍රභා කරන ලදී.

එසේ වුවද මාධ්‍ය විසින් වාර්තා කරන ඇත්තේ 1 හා 2 වගඋත්තරකරුවන් විසින් විජයදාස රාජපක්ෂ මහතා ගෙන් සමාව ගත් බවකි නමුත් කිසිදු අවස්ථාවක 1 හා 2 වගඋත්තරකරුවන් විසින් විජයදාස රාජපක්ෂ මහතා ගෙන් සමාව ඉල්ලා සිටියේ නැත .

අද දින මෙම ඇතිවූ එකගත්වය විකෘති කොට අධිකරණයට අපහාස වන අයුරින් වාර්ථා කොට ඇත . එනම් එම ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන් ලා විසින් 1 හා 2 වගඋත්තරකරුවන් හට දැඩි ලෙස අවවාද කර ඇති බවට සඳහන් කර ඇති වුවද එහිදී එලෙස දැඩි ලෙස අවවාද කිරීමක් සිදු නොවූ අතර විනිසුරුතුමන් ලා ඉතා සුහද ශීලීව සඳහන් කරන ලද්දේ මින් ඉදිරියට මෙවන් තත්වයන් ඇති නොවීමට වග බලාගන්නා ලෙසයි . කිසිදු අවස්ථාවක 1 හා 2 වගඋත්තරකරුවන් දැඩි ලෙස අවවාද කර කිරීමක් හෝ වෙනත් යම් ආකාරයක අප්‍රසාදය පල කිරීමක් එහිදී සිදු නොවිය.